# අධ්‍යාපන අමාත්‍යාංශය

# 9 ශ්‍රේණිය - 2 කොටස

# ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා







**මෙහෙයවීම -**

තාක්ෂණ ශාඛාව

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

එල්. එස්. කේ. වික්‍රමසිංහ මිය.

**සැලසුම් කිරීම සහ සකස් කිරීම -**

කේ. ඒ. ඩී. ප්‍රියානි ජයමැණිකේ මිය.

ගෘහ ආර්ථික විද්‍යා ගුරු උපදේශක

(කැලණිය අධ්‍යාපන කලාපය)


එස්. ඒ. ඩී. දුශාරා දිල්රුක්ෂි මිය.

බප/කැල සපුගස්කන්ද ම.වි.

තාක්ෂණික ක්ෂේත්‍රය

# 1 කෘෂිකර්මය

## 1.2 කෘෂිකාර්මික ගැටලු සඳහා හරිත කෘෂි තාක්ෂණික විසඳුම් යොදා ගනිමු





දුවේ පුතේ පෙළපොතේ පාඩම් කියවන්න. පහත දක්වා ඇති ක්‍රියාකාරකම්වල යෙදෙන්න. ඔබේ ක්‍රියාකාරකම් ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න. සතුටු වෙන්න. ඔබේ හැකියා හඳුනා ගන්න.

1 මිනිසා ඉහළ අස්වනු අපේක්ෂාවෙන් යොදා ගන්නා උපාය මාර්ග ලියන්න.

2 පරිසරයට හානි සිදුවන කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මොනවාද?

3 වන ආවරණයට හානි සිදුවන අහිතකර පාරිසරික බලපෑම් ලියන්න.




4 පාංශු ගුණාංග මොනවාද?

5 කෘෂි රසායන ද්‍රව්‍ය යෙදීමෙන් සිදුවන හානි ලියන්න.

6 <u>ජෛව ස්කන්ධය</u> යන්න අර්ථ දක්වන්න.





7 කෘෂි ක්‍රියාකාරකම් නිසා පරිසරයට සිදුවන හානිය අවම කර ගැනීමට යොදා ගත හැකි හරිත කෘෂි තාක්ෂණික විසඳුම් මොනවාද?

8 පාංශු පාරිසරික තත්ත්ව දියුණු කිරීම සඳහා යොදා ගන්නා හරිත තාක්ෂණික ක්‍රම මොනවාද?

9 කාබනික දියර පොහොර වර්ග ලියන්න.






10 වල් පැලැටි, කෘමි පළිබෝධ, රෝග පාලනය සඳහා යොදා ගත හැකි සරළ පළිබෝධ පාලන ක්‍රම ලියන්න.

11 බෝග වගාවේ දී ජල හානිය අවම කළ හැකි කෘෂි කාර්මික පිළිවෙත් මොනවාද?






12 පෙළ පොත අධ්‍යනය කර, එහි ක්‍රියාකාරකම සකසා මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය යොදා ගනිමින් ජීව වායු නිපදවන ආකාරය නිරීක්ෂණය කරමින් තොරතුරු රැස් කරන්න. ලකුණු ලබාගන්න.



තාක්ෂණික ක්ෂේත්‍රය

# 2 ආහාර

## 2.2 ආහාර කර්මාන්තය නගා සිටුවීම සඳහා ආහාර විවිධාංගීකරණයෙහි යෙදෙමු.





1 ආහාර විවිධාංගීකරණය යනු කුමක්ද?

2 ආහාර විවිධාංගීකරණයෙන්, පාරිභෝගිකයාට මෙන් ම නිෂ්පාදකයාට ලැබෙන ප්‍රතිලාභ ලියන්න.

3 ආහාර විවිධාංගීකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?





4 ආහාර විවිධාංගීකරණයේ දී පාරිශෝගික ආකර්ෂණය ඇති කරන සාධක ලියන්න.

5 ආහාරයක සෞඛ්‍යාරක්ෂිත බව නොමැති වන අවස්ථා නම් කරන්න.

6 ආහාර ඇසුරුම් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ලයිස්තුවක් ලියන්න.






7 තොග ඇසුරුම් සහ පාරිභෝගික ඇසුරුම් අතර වෙනස පහදන්න.

8 බහුල කාලයට ගස් යට වැටී අපතේ යන ආහාර ද්‍රව්‍ය තෝරා ගෙන එම ආහාර විවිධාංගීකරණය කරන්න උනන්දු වන්න.

9 ඒවා ආකරෂණීයව ඇසුරුම් කරන්න. ගුරුතුමා/තුමිය ට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.

10 පෙළ පොත අධ්‍යනය කරමින් නිවසේ දී දිය බත් හදන්න. ගුරුතුමා/තුමිය ට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.






## තාක්ෂණික ක්ෂේත්‍රය

# 3 ආරම්භක තාක්ෂණවේදය

### 3.2 අර්ථවත් නිමැවුම් කරමු








වර්තමානයේ මිනිසා තම වැඩ පහසු කර ගැනීමට විවිධ උපකරණ බොහොමයක් යොදා ගනියි.

1. ගොඩනැගිලි සෑදීමේ දී ඉහළ මහල්වලට ද්‍රව්‍ය සහ භාණ්ඩ ගෙන යාමට යොදා ගන්නා උපකරණය කුමක්ද?
2. එහි කප්පි භාවිත කර, ආයාසය, භාරය පිහිටන අයුරු රූපසටහනකින් ඇඳ පෙන්වන්න.














3. නිවසේ භාවිත වන වැඩ පහසු කරන උපකරණ නම් කරන්න.
4. වැඩ පහසු කරන උපකරණවල තිබිය යුතු ලක්ෂණ ලියන්න.
5. වර්තමාණයේ වෙළෙඳපොළේ පවතින විවිධ විදුලි පහන් වර්ග නම් කර ඒවා ඇඳ පෙන්වන්න.









6. පරිසර හිතකාමී බව පෙන්වන ලාංඡන අඳින්න.
7. ශීතකරණවල භාවිත වූ ඕසෝන් ස්ථරයට හානි කර වායුව කුමක්ද?
8. වර්තමානයේ ශීතකරණ සඳහා භාවිතා කරන ඕසෝන් ස්ථරයට හිතකර වායුව කුමක්ද?





9. පරිසරය දූෂණයවන අවස්ථා තුනක් ලියන්න.

10. ප්‍රතිචක්‍රීකරණය යනු ක්‍රමක් ද?

11. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි භාණ්ඩ ලයිස්තුවක් ලියන්න.

12. එම භාණ්ඩයකින් කළ හැකි නිර්මාණයක් කර ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න















13. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි යන්න දැක්වෙන සංකේතය අඳින්න.

14. ස්ත්‍රික් ආධාරකයක් සකස් කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න. ඔබට මේ සඳහා

15. මෙහි ප්‍රයෝජන ලියන්න.

දුවේ, පුතේ ඔබ කැමති නිර්මාණ එකතුවක් කරන්න. (අවමය පහයි) එය විධිමත්ව හැකි  ආකාරයකට ගුරුතුමියට / ගුරුතුමාට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.

ආදරණීය දුවේ පුතේ ඔබේ හැකියා හඳුනා ගන්න, නිර්මාණශීලී වන්න. නව නිපැයුම් ගැන සිතන්න. ලෝකය දිනන්න අලුතින් සිතන්න. ලොව ජයගත් පුද්ගලයන් ගැන වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න. අන්තර්ජාල තොරතුරු ගවේෂණය කරන්න. වැඩදායි පුරවැසියකු වන්න උත්සහ ගන්න.



ගුරුභවතුන්ට උපදෙස් -

- දරුවන් අගය කිරීමට පෙළඹෙන්න.
- දරුවන්ගේ ඇගයීම් වෙනුවෙන්, මෙම පාඩම් ආශ්‍රිතව, නිර්ණායක මත, ඇගයුම් ක්‍රමවේද නිර්මාණය කර ගන්න.
- නිදහස් නිර්මාණවලට සිසු දරුවන් යොමු කර අවස්ථා පහක් ඇගයීමට ලක් කරන්න.
- කාර්ය සාධන පත්‍රිකාව සඳහා ලබා දෙන ඇගයීම් ලකුණු මේ වෙනුවෙන් පිරිනමන්න.